332

RARE

# ග්‍රාමීය ප්‍රජා මූල සංවිධාන කළමනාකරණය හා එහි සංවර්ධන දිශානතිය

කේ.බී.බී.එම්.බී. බස්නායක

SOCI/M/18R/97

ප්‍රවේශ අංකය 332

වර්ග අංකය

ස.වි.ප.ති.

2003 ජුලී

කැ.වි.වි.

# නිබන්ධ සාරාංශය

ප්‍රජා සංවර්ධනය සඳහා ප්‍රජාමූල සංවිධාන දායක වන්නේ කෙසේද හා එහි සංවර්ධන දිශානතිය පිළිබඳව කරුණු අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනය තුලින් මූලික වශයෙන් අපේක්ෂා කෙරේ. ප්‍රජා සංවර්ධන සංකල්පය පැරණි සංකල්පයක් මෙන්ම සංවර්ධන ක්‍රියාවලියේ පැරණිතම සංවර්ධන ක්‍රමවේදයකි. ප්‍රජා සංවර්ධන ක්ෂේත්‍රයේ සංවර්ධන ක්‍රමෝපායන් ලෙසට ඉතා මෑතක ඉතා සාර්ථක ලෙස ක්‍රියාවට නැගෙන නවතම උපක්‍රමයක් ලෙස ප්‍රජා මූල සංවිධාන සංකල්පය හැඳින්විය හැකිය.

විශේෂයෙන් ලෝක බැංකු ආධාර මත බදුල්ල, මාතර හා රත්නපුර දිස්ත්‍රික්ක තුල ක්‍රියාත්මක කරන ප්‍රජා ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය මගින් සිය ප්‍රජා සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම හා ප්‍රජා ගත කිරීම සඳහා මෙම ප්‍රජා මූල සංවිධාන සංකල්පය යොදා ගෙන ඇති බව පෙනේ.

මෙම ප්‍රජා මූල සංවිධාන සංකල්පයේ සුවිශේෂත්වය වන්නේ අදාළ ප්‍රජා සංවර්ධන වැඩසටහනෙහි ප්‍රතිලාභී ප්‍රජාව එම වැඩසටහන් යෝජනාකරුවන්, සැලසුම්කරුවන්, නිර්මාණකරුවන්, මෙහෙයවන්නන්, ක්‍රියාත්මක කරන්නන් හා වගකීම් දරන්නන් බවට පත්වීමයි. මෙ ප්‍රජාවගේමය යන අරුත් ගන්වයි. (අපියි හැදුවේ අපේමයි මෙය) මේ සඳහා ඉතා ඉහළ මට්ටමේ සක්‍රීය ජන සහභාගීත්වයක් දක්නට ලැබේ. ශ්‍රී ලංකාව තුළ විවිධාකාර වූ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති විවිධ මුහුණුවරින් ක්‍රියාත්මක වෙයි. රාජ්‍ය මැදිහත්වීම් මත මෙන්ම රාජ්‍ය නොවන සංවිධාන මගින්ද ප්‍රජා කොටස් දායක කර ගනිමින්ද ප්‍රජා කොටස්වල දායකත්වය අවම වශයෙන්ද ලබා ගනිමින් එම සංවිධාන ක්‍රියාත්මක වනු දක්නට ලැබේ.

ජාත්‍යන්තර සැලසුම් ආයතනය මගින් ක්‍රියාත්මක කරන ලද ප්‍රජා ජල ව්‍යාපෘතිය සඳහා මෙම ක්‍රමය යොදාගෙන ඇත. ප්‍රජා මූල සංවිධාන සංකල්පය මෙතෙක් ප්‍රජා සංවර්ධන ක්ෂේත්‍රයේ ප්‍රජාව සංවිධානය කිරීමට ප්‍රජා සහභාගීත්වය ලබා ගැනීමට ප්‍රජාවට වගකීම් පැවරීමට යොදා ගත් අනෙක් සංවිධානයෙහි ක්‍රමවේදයන්ට වඩා සුවිශේෂී තත්ත්වයක් උසුලයි.

මෙම ප්‍රජා මූල සංවිධාන මගින් ඉටුවන කාර්යයන් පිළිබඳ විමර්ශනය කරන විට ප්‍රජා මූල සංවිධානවල සැකැස්ම අභිමතාර්ථ ක්‍රියාකාරීත්වය මනාව හඳුනාගත හැකිය. ප්‍රජාවගේ අවශ්‍යතා හඳුනා ගැනීම ඒ සඳහා ප්‍රජාව දැනුවත් කිරීම, ප්‍රජාව එම අවශ්‍යතා ඉටුකර ගැනීමට පෙළඹවීම, ඔවුන් තුළ නිසි ආකල්ප ගොඩ නැගීම ප්‍රජාවේ දායකත්වය ලබා ගැනීම ප්‍රජා සහභාගීත්වයෙන් වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම, එම ව්‍යාපෘතිය ඉදිරියට ගෙනයාම සඳහා අවශ්‍ය පුද්ගලයින් නිර්මාණය කිරීම අනතුරුව තම ගැටළු තම ප්‍රදේශ මට්ටමින්ම විසඳා ගැනීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම ඔවුන් විසින්ම සංවිධානය වීමේ ප්‍රවණතාවය ඇති කිරීම මෙම ප්‍රජා මූල සංවිධානයන්හි සාර්ථකත්වයට හේතු වී ඇත. එපමණක් නොව වෙනදාට වඩා ප්‍රජාව අතර සුහද සහයෝගී වාතාවරණයක් ඇති කිරීම මනා අන්තර් සබඳතා පවත්වා ගැනීමකට මහ සැලසීම හා එකිනෙකා කෙරෙහි සංවේදී

වීමට සලසා ඇති ඉඩකඩද අනෙකුත් සංවිධාන හමුවේ ප්‍රජාමූල සංවිධානය ප්‍රජාවේ ජනප්‍රිය භාවයට හේතු වී තිබේ.

ප්‍රජා මූල සංවිධාන හා එහි සංවර්ධන දිශානතිය යන්න අධ්‍යයනයේ පර්යේෂණ ගැටළුව වශයෙන් යොදා ගෙන තිබේ. බදුල්ල දිස්ත්‍රික්කයේ ජාත්‍යන්තර සැලසුම් ආයතනය මගින් ක්‍රියාත්මක කරන ලද ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා ප්‍රජාව සම්බන්ධ කර සැලසුම් කොට ප්‍රජාව මගින්ම ක්‍රියාත්මක කොට ප්‍රජාවටද වගකීම පැවරීම ප්‍රජාමූල සංවිධාන යන සංවිධාන සංකල්පය භාවිතා කොට ඇත.

මෙම අධ්‍යයනය සඳහා ප්‍රධාන පර්යේෂණ ක්‍රමවේදය ලෙස බදුල්ල දිස්ත්‍රික්කයේ බැද්දේගම ග්‍රාම සේවා වසමේ කොළණිය නම් නව ජනාවාසය ආශ්‍රිතව තෝරාගත් ප්‍රජාවට ප්‍රශ්නාවලියක් විධිමත් අවිධිමත් සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණ යන ප්‍රාථමික මූලාශ්‍ර ද්විතීයික මූලාශ්‍ර ක්‍රමය යොදා ගන්නා ලදි.

මෙම ජනාවාසයේ සිටින මුළු පවුල් සංඛ්‍යාව වන පවුල් 50 ගෘහමූලිකයින්ගෙන් ලබාගත් තොරතුරු රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල ක්ෂේත්‍ර නිලධාරීන් ව්‍යාපෘති නිළධාරීන් අතර විවිධ මට්ටමේ ව්‍යාපෘතියට සම්බන්ධ නිලධාරීන්ද ඇතුළු ප්‍රජා මූල සංවිධාන නායකත්ව සාමාජිකත්ව සමගත් කරුණු සාකච්ඡා කොට ලබාගත් තොරතුරු මේ සඳහා පාදක කොට ඇත.

විශේෂයෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන කිහිපයක නිලධාරියකු ලෙස සේවය කිරීමෙන් මා ලත් ප්‍රායෝගික අත්දැකීම් හා අවබෝධය මෙම පර්යේෂණයේ සාර්ථකත්වය සඳහා බෙහෙවින් ඉවහල් විය. ප්‍රජාව සමහ සම්බන්ධතා ගොඩ නැගීමට එය ඉමහත් පිටිවහලක් විය.

ප්‍රජා සංවර්ධනය සඳහා ප්‍රජාමූල සංවිධාන දායකත්වය ලබාදෙන බැවින් එම සංකල්පය සාර්ථක වූ ප්‍රජා සංවර්ධන ක්‍රියාවලියක ක්‍රමවේදය සඳහා භාවිතා කළ හැකි බව මෙම අධ්‍යයනයෙන් අනාවරණය විය.

එමෙන්ම යම් කාර්යයක් සාර්ථක වන්නට නම් ප්‍රතිලාභ ලබන්නන් කණ්ඩායමේ අවශ්‍යතාවයන් මත ප්‍රතිලාභ ලබන්නන් සහභාගී කරවා ගැනීමෙන්ද හා සංවර්ධන කටයුතු කිරීමට යොදා ගැනීමෙන්ද දායක කරගත යුතුය.

ප්‍රජා සංවර්ධන කටයුතු වලට ප්‍රජාවගේ සක්‍රිය සහභාගීත්වය ලබාගැනීම සඳහා යොදා ගැනෙන සංවිධානමය ක්‍රමවේදයන් පිළිබඳව ප්‍රජාව තුල දළ අවබෝධයත්, විශ්වසනීයත්වයත් සබඳතාවයන් ගොඩ නැගීම ව්‍යාපෘතියේ සාර්ථක අසාර්ථක භාවය රදා පවතී. අනෙකුත් සංවිධාන කෙටි කාලයකින් අභාවයට යන්නෙන් අක්‍රිය වන්නෙත් පූර්ණ ප්‍රජා සහභාගීත්වය ලබා නොදීමට නොලැබීමට හේතුව ප්‍රජාව බද්ධ කර ගන්නා ආකාරයේ ඇති දුර්වලතාවයයි. ප්‍රජා මූල සංවිධාන මගින් ප්‍රජාව දායක කර ගන්නා ආකාරය තුල එම

ප්‍රශ්නයට පිළිතුරු සැහවී තිබේ.

සුවිශේෂීව සංවර්ධනය වන රටවල් ඉක්මන් සංවර්ධනයක් කරා ලගාවීමට නම් ප්‍රජාමූල සංවිධාන සංකල්පයෙන් දෙන පණිවුඩය තේරුම්ගත යුතුය. එය මනාව ක්‍රියාවේ යෙදවිය යුතුය.

ප්‍රජා සංවර්ධනයේ නියම පංගුකාරයින් වන ග්‍රාමීය ප්‍රජාව එහි නියම උරුමක්කාරයින් කිරීමට නම් ඔවුන් සතු ආවේණික ආයතන පද්ධතිය දියුණු කළ යුතුය. ක්ෂුද්‍ර මට්ටමින් රාජ්‍ය අනුග්‍රහය ලබා දිය නොහැකි තත්ත්වයක් තුළ මෙන්ම රාජ්‍ය මැදිහත්විම කෙරෙන් ජනතාව ඈත්ව යන තත්ත්වයක් තුල මෙබඳු ප්‍රජා කොටස් පැහැදිලිව සන්ධානගත කළ හැක්කේ ඔවුන්ගේම සංවිධාන විශේෂයක් තුලය.

එහෙත් එම ප්‍රජා මූල සංවිධානවල පවතින ගතානුගතික නායකත්ව රටාවන් හා විදාත්මක නොවූ කළමනාකරණ වේදයන් ක්‍රමයෙන් ඉවත් කොට අරමුණුගත හා තිරස්ථායි පැවැත්මකට යොමු කරන්නා වූ රාජ්‍ය හා පෞද්ගලික අංශ ඒකාබද්ධ මෙහෙයුමක් අවශ්‍යව පවතී. එය පියවරින් පියවර සැලසුම් කොට ජාතික තලයේ ප්‍රතිපත්ති රාමුවක් සකසා දේශපාලන හා ආර්ථික නායකත්වයක් තුළ හැදී වැඩී ඒමට සැලැස්විය යුතුය.